**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය - 2021**

**----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2019 පෙබරවාරි 21 දින මණ්ඩලය වෙත භාර දී තිබුණු පිරිවැය රු. මිලියන 587.5, ක් වටිනා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව පූර්වකාලපරිච්ඡේද වැරදි අතීතානුයෝගීව නැවත ප්‍රකාශ කිරීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර පිරිවැය වෙනුවට ටෙන්ඩර් වටිනාකම වූ රු. මිලියන 597.2 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම් එකතු කිරීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිල්ලේ සමුච්චිත ක්ෂය ප්‍රමාණය වූ රු. මිලියන 21.5 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කර 2021 වර්ෂයේ ගිණුම් නැවත ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට පොත්වල අගය ශුන්‍ය වූ තවදුරටත් භාවිතා කරමින් පැවති පිරිවැය රු. මිලියන 67.5ක් වූ විද්‍යාත්මක උපකරණ අයිතම 214 ක් , ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ඵලදායි ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය කර, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |
| (ඇ) | මණ්ඩලයේ නිර්විනාශක පරීක්ෂණ විද්‍යාගාර සතු පිරිවැය රු. මිලියන 33.3, වූ අක්‍රීය විද්‍යාත්මක උපකරණ 23 ක සහ පිරිවැය තොරතුරු නොමැති උපකරණ 16ක ධාරණ අගය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් කළ යුතු වුවත්, අදාල හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | පූර්ව කාලපරිච්ඡේද වැරදි අතීතානුයෝගී ලෙස නැවත ප්‍රකාශ කිරීම නිසා පූර්ව වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල රේඛීය අයිතමයන් 6 ක් ප්‍රතිශෝධනය කර තිබුණද, මෙම ප්‍රතිශෝධිත අයිතමයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය වෙත ලැබී තිබූ රු. මිලියන 96.6ක ප්‍රාග්ධන ප්‍රදාන සහ විදේශ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු. මිලියන 75.9 ක් වටිනා කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය තොගය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කොබෝල්ට් 60 මූලද්‍රව්‍යයේ ක්ෂය වටිනාකම රු. මිලියන 4.7කින්ද කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ ක්ෂය රු. මිලියන 2.3කින්ද ගොඩනැගිලි ක්ෂය රු මිලියන.11.7 අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු. 18 .7 මිලියන කින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂික ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය ආනයනයට අදාල රේගු ගාස්තුව රු. මිලියන 15.4ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | රේගු ගාස්තු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සේවාදායක ආයතන 119 ක් වෙත කුලී පදනමින් නිකුත් කර තිබුණු තාප සංදීප්ත විකිරණ මිතිකමාන කාඩ්පත් ( TLD ) 2,762 ක් අගය කර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පහත හේතු අනුව TLD කාඩ්පත් භාවිතයට ගත් පසුව ස්ථාවර හෝ අර්ධ ස්ථාවර වත්කමක් ලෙස සලකා ගිණුම් ගත කිරීමට අපහසුය.වරින් වර විවිධ මිල ගණන් යටතේ මිලදීගත් කාඩ්පත් ඉහත තොගය යටතේ පැවතීම, කාඩ් පතෙහි ගුණාත්මක බව එය භාවිත කල කාලයට අනුරූපී නොවීම නිසා කාලය අනුව වටිනාකම ක්ෂයවීම ගණනය කිරීමට නොහැකි වීම, තාක්ෂණික හේතු මත භාවිතයට ගත නොහැකි අවස්ථාවට පත්වූ පසු භාවිතයෙන් ඉවත් කිරීමට සිදු වීම. | වත්කමේ ස්වභාවය අනුව සුදුසු ක්‍රමවේදයක් භාවිතාකරමින් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 වර්ෂයේ මිලදීගත් කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය අපහරණ වියදම (De commissioning cost) වෙනුවෙන් සිදුකරන වෙන්කිරීම සඳහා විදේශ විනිමය ලාභ අලාභ ගලපා නොතිබුණි. එසේම, 2021 වර්ෂයේ මිලදීගත් කොබොල්ට් 60 මූලද්‍රව්‍යයට අදාළ අපහරණ වියදම් හඳුනාගෙන ඒ වෙනුවෙන් කිසිඳු වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අපහරණ වියදම් සඳහා නිවැරදිව වෙන්කිරීම් සිදුකළ යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කලමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | | | |
| (අ) | කොබෝල්ට් 60 මිලදීගැනීම | 120.7 | කොන්ත්‍රාත් ගිවිසුම | BRIT ආයතනය වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | නොපමාව විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | තොග | 17.0 | සතොයක්ෂණ වාර්තා | ගබඩා අයිතම සතොයක්ෂණය කල අතර විද්‍යාත්මක අංශ විසින් ලබාදෙන තොග පිළිබඳ සතොයක්ෂණ වාර්තා 2022 වර්ෂයේ සිට ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

**1.6 මුදල් කලමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු මසදී කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය මිලදීගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණු රු. මිලියන 96.5ක් අදාල කාර්යය සඳහා භාවිතා කිරීමකින් තොරව මාස 9 ක පමණ කාලයක් ආයතනයේ ජංගම ගිණුමේ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.එසේම 2021 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලද රු. මිලියන 35.6ක්ද වර්ෂයේ වියදම් නොකර මණ්ඩලයේ ජංගම ගිණුමේ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. | 2020-2021 වර්ෂ සඳහා සැලසුම් කරන ලද ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් මෙම මුදල් ලද අතර ඇතැම් ප්‍රසම්පාදන කටයුතු විදේශ විනිමය ප්‍රතිපත්තිය වෙනස් වීම සහ මිල ගණන් අධික ලෙස වැඩිවීම යන හේතු මත අවසන් කරගත නොහැකි විය.ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇති වුවහොත් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන සැලසුම් අනුව අදාල ප්‍රසම්පාදනයන් සිදුකල යුතු අතර ආයතනය තුල මුදල් නිෂ්කාර්යව රඳවාගැනීම සිදු නොකළ යුතුය. |

**1.7 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මුදල් රෙගුලාසි 454 සහ 715(2)(අ), (ඇ), (උ), (ඉ) හා (ඊ) | නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ විද්‍යාගාරවල ඇති විද්‍යාත්මක උපකරණවල ආරක්ෂාව තහවුරු වන ආකාරයෙන් බඩු වට්ටෝරු පොත් පවත්වාගෙන යාම, උපකරණවල භාරය සම්බන්ධයෙන් වගකිවයුතු නිළධාරීන් පත්කිරීම, විධිමත් අනුමැතියක් සහිතව උපකරණ නිකුත්කිරීම හා විධිමත් වාර්තා පවත්වාගෙන යාම සිදුකර නොතිබුණි. | නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | මුදල් රෙගුලාසි 715(ඇ) සහ 104 (1) | නිසි අධිකාරි බලයක් යටතේ භාණ්ඩ නිකුත් කිරීම සහ නියාදනය කළ යුතු වුවත් රු. මිලියන 10.8ක වටිනාකමැති එක්ස් කිරණ යන්ත්‍රයක් නිසි අධිකාරී බලයක් යටතේ නිකුත් කර නොතිබුණු අතර නැවත භාරගැනීමේදී විධිමත් ලෙස භාරගෙන නොතිබුණි.මෙම යන්ත්‍රය ඉන් පසු අක්‍රීය වී තිබුණු අතර ඊට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ සිදු කර නොතිබුණි. | -එම- | -එම- |
| (ආ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ මුදල් ප්‍රදාන රු. මිලියන 2.1ක්ද භාණ්ඩ ප්‍රදාන රු මිලියන 8.0ක්ද වශයෙන් එකතුව රු. මිලියන 10.1ක් වූ විදේශ ප්‍රදාන ලැබීම් භාණ්ඩාගාරය හරහා ලබා නොගෙන සෘජුවම ආයතනය වෙත ලබා ගෙන තිබුණි. | 2022 වර්ෂයේදී මේ අනුව කටයුතු කරනු ලැබේ. | චක්‍ර ලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය මඟින් නිකුත් කර ඇති මාර්ගෝපදේශය | මූල්‍ය නොවන වත්කම් වර්ෂ පහකට වරක් තක්සේරු කළ යුතු වුවත් මණ්ඩලය සතු පිරිවැය රු. මිලියන 2.317.8 ක් වූ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරි වර්ෂයේදී වත්කම් තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 22.7ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 3.9ක් වූයෙන්මූල්‍ය ප්‍රතිඵලයෙහි රු . මිලියන 26.6ක පිරිහීමක් නිරීක්ෂණය විය. භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රතිපාදන රු. මිලියන 61 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කලමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයේ ඒකකයන් කිහිපයක් විසින් (NCBNDT, Training unit සහ Inspection body) නිර්විනාශක පරීක්ෂණ සම්බන්ධ පාඨමාලා පැවැත්වීම හා සම්බන්ධ කටයුතු සහ බාහිර පාර්ශව වෙත පරීක්ෂණ සේවා සැපයීම ආදී කාර්යයන් සිදුකරමින් පැවතුණද එම කටයුතු සම්බන්ධයෙන් භාවිතා කරන අන්තර්ජාතික ප්‍රමිත ශ්‍රී ලංකාව තුළ නීතිගත කිරීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන කෙටුම්පත් කර නොතිබුණි. | NDT සේවා වලින් පසුව ලබාදෙන NDT INSPECTION වාර්තාවල වලංගුභාවය රදාපවතින්නේ එය සිදු කරනු ලබන පුද්ගලයන්ගේ සුදුසුකම් මත පමණක් වන අතර ඕනෑම පුද්ගලයෙකුට හෝ ආයතනයකට NDT සේවා සිදුකිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ගත් පසුව එම සේවා සිදුකිරීමට කිසිදු බාධාවක් නොමැති අතර, එය නියාමනය කිරීමට මෙතෙක් ලෝකයේ හදුනාගත් ප්‍රයෝගික ක්‍රමයක් නොමැත. | නිර්වනාශක පරීක්ෂණ සම්බන්ධ කාර්යයන් නියාමනය සඳහා ස්වාධීන ආයතනයක් පිහිටුවිය යුතු අතර අන්තර්ජාතික ප්‍රමිතවල වලංගුභාවය සඳහා අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සම්පාදනය කළ යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේදී නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම පවරාගැනීම හේතුවෙන් නව ගොඩනැගිල්ලක් ඉදිකරවා ගෙන තිබුණද එම ගොඩනැගිල්ල පිහිටි ඉඩම පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද උක්ත ඉඩම තෝරාගැනීමට පෙර මාලඹේ ප්‍රදේශයේ ඉඩමක් | නව ඉඩමේ අයිතිය පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කෙටුම්පත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය විදුලිබල හා බලශක්ති මණ්ඩලය වෙත යොමුකර ඇත. ඉදිරියේදී නාගරික සංවර්ධන අධිකාරිය හා ජාතික | ඉඩමේ අයිතිය විධිමත්ව පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවූ බදුකුලිය සම්බන්ධයෙන් අදාල |

| | | |
|---|---|---|
| තෝරාගෙන නව කැළණි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය විසින් මණ්ඩලය වෙනුවෙන් රු. මිලියන 333.4ක් වැයකර ගොඩනැගිල්ලක් ඉදිකරමින් පැවතියදී මහජන විරෝධතා නිසා අතර මඟ නවතා දැමීම නිසා වැයකර තිබුණු මුදල් අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. මාලබේ ඉඩම සඳහා මුදල් ගෙවීමේදී පැරණි ගොඩනැගිල්ල පැවති ඉඩම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරියට ගෙවූ බදු කුලිය වූ රු. මිලියන 7.7ක් අඩු කර ගෙවිය යුතු වුවත්, එසේ අඩුකර ගෙවීම සිදුකර නොතිබුණි. මෙම ඉඩමේ වෙළඳපොළ වටිනාකම රු. මිලියන 116ක්ද, අවුරුදු 30 ක් සඳහා බදු වටිනාකම රු. මිලියන 75.5ක්ද වූ රජයේ තක්සේරුව නොසලකා රු. මිලියන 181ක් ගෙවා තිබුණි. | ආධුනිකත්ව මණ්ඩලය සමග මේ පිළිබඳව සාකච්ඡාකර කටයුතු සිදුකරනු ලැබේ. | ක්‍රියාමාර්ග ගත අවශ්‍ය යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. මිලියන 450ක් වටිනා කොබෝල්ට් 60 මූලද්‍රව්‍ය සහිත පැන්සල් 52 ක් වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි ඉන්වෙන්ට්‍රි ගත කර නොතිබුණු අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලදී එම ද්‍රව්‍ය භෞතිකව පරීක්ෂා කර වාර්තා කර නොතිබුණි. | මෙම කොබෝල්ට්-60 පැන්සල්, අධික විකිරණශීලීතාවයක් සහිත බැවින් සමීපයට ගොස් භෞතිකව නිරීක්ෂණය කල නොහැකි අතර ජල තටාකය තුල මෙම විකිරණශීලී පැන්සල් අදාළ රාක්කයේ ස්ථානගතකළ පසු ජල තටාකයට ඉහල සිට නිරීක්ෂණය කල හැකිය. ඉදිරියේදී ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු කරනු ලැබේ. | විධිමත්ව ඉන්වෙන්ට්‍රි ගත කර නිසි ක්‍රමවේදයකට භෞතිකව පරීක්ෂාකල යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ක්‍රීට් පරීක්ෂාව සඳහා 2018 වර්ෂයේ පෙබරවාරි මස රු. මිලියන 1.7කට මිලදීගත් Concrete Core Drilling උපකරණය මිලදී ගත් දින සිට 2022 ඔක්තෝබර් 31 දක්වා නිෂ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | වත්කමේ අවශ්‍යතාවය හඳුනාගෙන මිලදීගත යුතු අතර කාර්යක්ෂමව භාවිතයට ගත යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී වැඩ නිමකරන ලද නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථාන | මෙම විමසුම සම්බන්ධව අමාත්‍යාංශය මඟින් සමාලෝචනයක් සිදුකරමින් පවති | කොන්ත්‍රාත් විචලනයන් අවම |

| | | |
|---|---|---|
| ගොඩනැගිල්ලේ අනුමත කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 308.6ක් වුවත් රු. මිලියන 120.9ක් හෙවත් සියයට 39 ක කොන්ත්‍රාත් විචලනයක් සහිතව ඉදිකිරීම් සිදුකර තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.13.4 සහ 2012 අගොස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොන්ත්‍රාත් විචලනය සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2022 ඔක්තෝබර් 28 දින දක්වා ලබාගෙන නොතිබුණි. ඉඩම මිලදීගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු රු. මිලියන 84ඉක්මවා ඉඩමේ තක්සේරුව වූ රු. මිලියන 85ක් ඇතුළුව ඉඩම සඳහා රු. මිලියන 90.8ක් වැයකර තිබුණි. | | කිරීමට කටයුතු කළ යුතු අතර අදාල අනුමැතිය ලබාගත යුතුය. |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් අතුලත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද මණ්ඩලය විසින් ගිණුම් වර්ෂය අවසන් වී දින 217 ක් පසු වී ගිණුම් ඉදිරිපත් කර තිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලයට මූල්‍ය ප්‍රකාශන අදාල ආයතන වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා නිසිලෙස අයවැය පුරෝකථනය නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 16 ක එකතුව රු. මිලියන 3.7කින් වියදම් සීමාව ඉක්මවා ගෙවීම් කර තිබුණු අතර පුනරාවර්තන වැය විෂයයන් 6 ක අයවැයගත ප්‍රතිපාදනයෙන් සියයට 30 සිට සියයට 100 දක්වා වූ පරාසයකින් හිතකර විචලනයන් ( ඉතිරිවීම් ) නිරීක්ෂණය විය. | අයවැය ප්‍රතිපාදනය හා තත්‍ය වියදම අතර වෙනස අවම වන පරිදි කටයුතු කරනු ලැබේ | වඩා තාත්වික ලෙස අයවැය පුරෝකථනය කළ යුතු අතර අයවැය ලේඛණය කාර්යක්ෂම පාලන උපකරණයක් ලෙස යොදාගැනීමට කටයුතු කළ යුතුය. |